# 40

# තුන්වන බුවනෙකබාහු රජවීම වන්නි පාලකයන්ගේ නැගීසිටීමක් ද?

*ජේ. එම්. සුධර්මාවතී*

වර්තමාන වයඹ පළාතේ ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ ද ප්‍රධාන නගරය වන කුරුණෑගල ලාංකික දේශපාලන ඉතිහාසයේ එක් කේන්ද්‍රස්ථානයකි. සියවස් පහළොවක් පමණ වූ කාල පරිච්ඡේදයක් පුරා ලාංකික ශිෂ්ටාචාරයේ තෝතැන්න වූ අනුරාධපුරය හා පොළොන්නරුව කේන්ද්‍ර කරගෙන පැවැති රජරට ශිෂ්ටාචාරය ක්‍රි.ව. දහතුන්වන සියවසේ ආරම්භයේ පටන් දේශපාලනික හා ස්වාභාවික හේතූන් ගණනාවක් ම නිසා ක්‍රමයෙන් පරිහානිය කරා ගමන් කරන්නට විය. (සිරිවීර, 2002, 108-115) මේ පරිහානිය වේගවත් කිරීමේ ආසන්න ම හේතුව ලෙස ප්‍රබල සේනාවක් සමඟ කාලිංග දේශයේ සිට පැමිණි මාඝ නම් අධාර්මික ආක්‍රමණිකයාගේ විනාශකාරී ක්‍රියා කලාපය හේතු වී තිබේ. (CV., Lxxx, 54.-75)

මෙසේ රජරට බිඳවැටීමෙන් පසුව සිංහල රාජධානි නිරිතදිගට සංක්‍රමණය වීමේ දී මායා රට තුළ රාජ්‍ය බලය කේන්ද්‍රගතවීමේ ප්‍රතිඵලය වූයේ මුලින් ම දඹදෙණියත් එයින් පසු ව පිළිවෙළින් යාපහුව හා කුරුණෑගල රාජධානි බවට පත්වීමයි. මේ රාජධානින්හි විශේෂත්වය වන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ස්ථාන තුන ම පිහිටීම යි. දඹදෙණි හත්පත්තුවේ දඹදෙණියත්, වන්නි හත්පත්තුවේ යාපහුවත් වැළඩවිලි හත්පත්තුවේ කුරුණෑගලත් පිහිටා තිබේ. (J.R.A.S. (C.B), vol:vi, 1963, 105, 95,) හස්තිශෛලපුර, හස්තිගිරිපුර, හස්තිපුරනුවර, හස්තිගිරි, හස්තිසෙල, කුරුණෑගල්පුර, කුරුණෑගල් පාය, ඇතුගල්පුර වැනි (සුමනජෝති හිමි, 2005, 17, / Modder, 1893, 36, / සන්නස්ගල, 1964, 139) විවිධ නාමයන්ගෙන් හඳුන්වන කුරුණෑගල නගරය රමණීය භූමි භාගයක පිහිටා තිබේ. මෙය ප්‍රධාන වශයෙන් ම ඇතෙකුගේ හැඩයෙන් යුත් කන්ද ඇතුළු තවත් විවිධ සතුන්ගේ හැඩ ගත් (ආදාගල, ඉබ්බාගල, එළුවාගල, කුරුමිණිගල, කිඹුලාගල) කඳු පන්තින්ගෙන් වට වී ඇත.

වර්තමාන කුරුණෑගල නගරය පිහිටා ඇති භූමි භාගය කේන්ද්‍ර කරගනිමින් 14 සියවසේ රාජධානියක් පිහිටුවා ගැනීමට පෙර සිට ම වර්තමාන කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් භූමි ප්‍රදේශය ඓතිහාසික අතින් වැදගත් ස්ථාන ගණනාවකින් ම යුක්ත වේ. ත්‍රිසිංහලේ බෙදීම් අනුව මායා රටට අයත් රටවලින් එකක් වූයේ කුරුණෑගල් රාජ්‍යයයි. (අභයවර්ධන, 1978, 53) වර්තමාන කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් භූමි



ප්‍රදේශය මහනුවර රාජ සමයේ බෙදීම් අනුව සත්කෝරළයට අයත්ය. (ගොඩකුඹුරේ, 1965, 53-54, / ලියනගමගේ, 1989, 210-213) ඓතිහාසික මූලාශ්‍රය වන **මහාවංසයේ** හා **පූජාවලියේ** කුරුණෑගල ගැන සඳහන් වන්නේ දඹදෙණියේ රජ පැමිණි දෙවන පරාක්‍රමබාහු රජ දවස සම්බන්ධ විස්තරයන්හි දී ය. දඹදෙණිය රාජකීය මධ්‍යස්ථානය වීමෙන් පසු ව ඊට ආසන්න ප්‍රදේශ කෙරෙහි දක්වූ සැලකිල්ල හේතු කරගෙන කුරුණෑගල වෙත ද අවධානය යොමු කර ඇත. දෙවන පරාක්‍රමබාහු රජුගේ නියමය පරිදි යුවරජ, සොහොයුරු භුවනෙකබාහු මහාමහින්දබාහු නමින් පිරිවෙනක් ඉදි කරවා උත්කර්ෂවත් අන්දමින් ආගමික උත්සවයක් පවත්වන ලදි. (C.v., LXXXV; 3) යුවරජ හස්තිගිරි පුරයෙහි ජීවත් වූ බව දෙවන පරාක්‍රමබාහු රජුගේ ජ්‍යෙෂ්ඨ පුත් විජයබාහු කුමරු කුරුණෑගල මුල් කරගෙන සිදු කර තිබෙන කටයුතුවලින් අනුමාන කළ හැකි ය. **මහාවංසයට** අනුව,

"ඉක්බිති මිහිපල් තෙමේ හස්තිගිරිපුරවරයට ගොස් එහි දී සුළු පියරජහු විසින් කරවන ලද සිත්කළු වූ මහා විහාරයෙහි උහුගේ ම සතතයෙන් පිදිය යුතු ශරීර නිඃක්ෂෙපස්ථානය ද නැවත නැවත බලමින් වීරබාහු නරේන්ද්‍රයා ද සේනාව ද සමග කනස්සලු වූයේ එහි දී අනිත්‍ය ලක්ෂණය නැවත නැවත ඉපද වී. ඉක්බිති එහි තුන්මහල් උතුම් පිළිම ගෙයක් කරවා එහි මහත් බුදුපිළිරුවක් කරවීය. අනතුරුව සුළු පියහු පිළිරුව සර්වාභරණයෙන් සරහන ලදහු මොනවට කරවා එහි ම තැබ්බ වී. මිහිපල් තෙමේ පිළිම ගෙයට ද (සුළු පියහු) ඒ රුවට ද මනහර වූ කැපපසගම් හා බොහෝ පිරිවර මිනිසුන් ද දී උහු නමින් භුවනෙකබාහු පිරිවෙණයයි නාමය ද තැබුයේ යි, ඊට ඉක්බිතිව ඒ නුවර නරනාරී ජනයාගෙන් සමාකීර්ණ කොට පව්රු පිරි ආදින් පිරිකෙව් ද කරවි" යනුවෙන් සඳහන් වේ. (Cv., LXXXVIII: 53-60)

විජයබාහු කුමරු මෙලෙස කුරුණෑගල ශාසනික කටයුතු පමණක් නොව ජනාකීර්ණ නගරයක් බවට පත් කර නගරය වටා ප්‍රාකාරයක් හා දිය අගලක් ද කරවීමෙන් පැහැදිලි වන්නේ දේශපාලන අතින් ආරක්ෂාව ද ලබාදෙමින් විධිමත් නගරයක් කර වූ බවයි. මෙතැන් සිට කුරුණෑගල සැලසුම් සහගත නගරයක් ලෙස වැදගත්කමින් යුක්තවීමේ ප්‍රතිඵලයක් ලෙස පසු කලෙක දඹදෙණි පරම්පරාවේ පාලකයන් කුරුණෑගල රාජධානියක් බවට පත් කර ගන්නට ඇත.

කුරුණෑගල රාජධානියක් බවට පත් කර ගැනීමට හේතු වී ඇත්තේ රජ පවුලේ කුමාරවරුන් අතර හටගත් ගැටුම් සහිත පසුබිමයි. මෙම ආභ්‍යන්තරික අර්බුදකාරී දේශපාලනික පසුබිමේ ආරම්භය දඹදෙණියේ රජ පැමිණි හතරවන විජයබාහු රජුගේ ශෝචනීය අකල් මරණයත් සමග ඇරඹිණි. රජුගේ දෙවන රාජ වර්ෂයේ දී සේනාපති විසින් දාසයකු ලවා රජු මරණයට පත් කරන ලදි. (Cv., XC, 2-4) රජුගේ බාල සොහොයුරු භුවනෙකබාහු කුමාරයා මරා දැමීමට උත්සාහ ගත් නමුත් කුමරු එයින්

බේරී පලාගොස් ආර්යබට සේනාවේ ආධාර ඇති ව රජ වී ටික කලක් දඹදෙණියේ සිටිමින් පසු ව යාපහුව රාජධානිය බවට පත් කර ගත්තේ ය. විදේශීය ද්‍රවිඩයන් වූ කාලිඟරායර හා චෝඩගඟදේව විසින් එල්ල කළ ආක්‍රමණයන් හා සිංහල වන්නි රජුන් පිරිසක් ද කළ අවුල් බිඳ හෙළමින් සාමකාමී වාතාවරණයක් සකස් කර ගනිමින් ශාසනික සේවාවන්හි නිරතවෙමින් භුවනෙකබාහු රජු එකොළොස් අවුරුද්දක් රාජ්‍යය විචාළේය. (Cv., XC, 8-42)

පළමුවන භුවනෙකබාහු රජතුමාගේ අභාවයෙන් පසුව ඉතිහාසය තරමක අවුල් සහගත වූ අතර දේශපාලනික වශයෙන් අරාජික තත්ත්වයක් ගෙන තිබේ. (**දළදා සිරිත**, 1961, 45) දුර්භික්ෂයක් හටගෙන ඇති අතර පාණ්ඩ්‍ය ආක්‍රමණයක් ද එල්ල වී තිබේ. (Cv., XC,. 43-48) ආර්යචක්‍රවර්ති නම් වූ පාණ්ඩ්‍ය දේශයේ සිටි ප්‍රබල ඇමැතියෙක් එහි නායකත්වය ගෙන විශාල සේනාවක් රැගෙන විත් අගනුවර ආක්‍රමණය කළේ ය. සියලු වස්තු සම්පත් කොල්ලකා දළදා වහන්සේ ද පාණ්ඩ්‍ය දේශයට රැගෙන ගියේ ය. මෙම වාතාවරණය තුළ හතරවන විජයබාහු රජතුමාගේ පුත් පරාක්‍රමබාහු නම් කුමාරයෙක් රාජ්‍ය බලය ලබාගෙන පාණ්ඩ්‍ය දේශයට ගොස් පාණ්ඩ්‍ය පාලක කුලශේකර රජු හමුවී දළදා වහන්සේ ලබාගෙන පොළොන්නරුවේ සිට රාජ්‍යය ගෙන ගියේ ය. (Cv., XC, 49-56) "දළදා පූජෝපහාර ඇතුළු ශාසනික සේවාවන් ඉටු කර ලොකශාසනාභිවෘඬිය කොට මරණ ප්‍රාප්ත වූයේය" යැයි **මහාවංසයේ** ඇතැම් පිටපත්හි සඳහන් වේ. (Cv., XC, 57-59) තුන් වන පරාක්‍රමබාහු රජු ස්වාභාවික මරණයට පත් වූ බවක් නොව දෙවන භුවනෙකබාහු විසින් ජීවිතක්ෂයට පත් කර තිබෙන බව **මහාවංසයේ** 90 පරිච්ඡේදයේ 57 සිට 63 දක්වා ගාථාවන්හි සඳහන් පිටපත් ද තිබේ. (ම.ව. 255 පිටුව) මේ අනුව තුන්වන පරාක්‍රමබාහු හා පළමුවන භුවනෙකබාහු රජතුමාගේ පුත් භුවනෙකබාහු අතර සිහසුන සඳහා ආරවුලක් පැවති බව පෙන්නුම් කෙරේ. මෙයින් ජයග්‍රහණය කළ භුවනෙකබාහු දළදා වහන්සේ ද පොළොන්නරුවෙන් රැගෙනවිත් කුරුණෑගල දී සිංහාසනාරූඪ විය. දෙවන භුවනෙකබාහු රජු කුරුණෑගල තම රාජධානිය බවට පත් කර ගත් බව **මහාවංසයේ** දක්වෙන්නේ "ශුභ පර්වත පුරාධිපති වූ භුවනෙකබාහු නරේන්ද්‍රයාණන් පුත්‍ර භුවනෙකබාහු ක්ෂත්‍රිය තෙම හස්තිශෛල පුරයෙහි රජ වූයේ ය" යනුවෙන් ය. (Cv., XC., 60) මෙලෙස ඇරඹුණු කුරුණෑගල රාජධානියේ සිට සිහසුන දැරූ පාලකයෝ හතර දෙනෙක් වූහ. දෙවන භුවනෙකබාහු (ක්‍රි.ව. 1293-1302), (Cv., XC., 60) හතරවන පරාක්‍රමබාහු, (ක්‍රි.ව. 1302-1326), (Cv., XC., 64,65) තුන්වන භුවනෙකබාහු, (ක්‍රි.ව. 1326-1335), (Cv., XC., 105) හා පස්වන විජයබාහු (ක්‍රි.ව. 1335-1341). (Cv., XC., 105, 106) (ඉලංගසිංහ, 1996, 1)

යාපහුවේ පළමුවන භුවනෙකබාහු රජුගේ පටන් ගම්පොළ හතරවන භුවනෙකබාහු රජ දවස දක්වා කාල පරිච්ඡේදය තුළ සිහසුන්



දැරූ පාලකයන්ගේ රාජ්‍යකාල පිළිබඳ නිරවුල් බවක් නැත. **මහාවංසයට** අනුව දෙවන භුවනෙකබාහුගේ දෙවන රාජවර්ෂයේ දී අනිත්‍යභාවයට පැමිණයේ යැයි සඳහන් කරයි. (Cv., XC., 63) **රාජරත්නාකරයේ** රාජ්‍යකාලය වසර විසිහතරකින් කෙළවර විනැයි සඳහන් වේ. (**රාජරත්නාකරය**, 1995, 118) **දළදා සිරිත**ට අනුව රජු වාර්ෂික දළදා උත්සව නවයක් පවත්වා තිබේ. (**දළදාසිරිත**, 1961, 46) ඒ අනුව අඩු ම වශයෙන් වර්ෂ නවයක් පමණවත් සිහසුන දරා තිබේ. ඔහු ඇවෑමෙන් සිහසුන් පත් වූයේ හතරවන පරාක්‍රමබාහු රජතුමාය. මේ කුමරු භුවනෙකබාහු රජතුමාගේ අභිජාත පුත්‍රයාය. (Cv., XC., 46) හතරවන පරාක්‍රමබාහු රජතුමා සිහසුනට පත් වූයේ ක්‍රි.ව. 1302 දී යැයි **සරජෝතිමාලෛ** නම් ද්‍රවිඩ කෘතියට අනුව අනුමාන කෙරේ. (ල.වි.ල.ඉ. 1972, 601) මේ නිසා එතැන් සිට වසර නවයක් ආපස්සට යමින් දෙවන භුවනෙකබාහු රජුගේ රාජවර්ෂ ක්‍රි.ව. 1293 සිට 1302 දක්වා යැයි සැලකේ.

හතරවන පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලයේ අවසානය දැන ගැනීමට ද **මහාවංසයෙන්** කිසිදු සලකුණක් නොලැබේ. **දළදා සිරිත** මේ රජ දවස රචනා කළ හෙයින් යටත් පිරිසෙයින් ක්‍රි.ව. 1326 දක්වා සිහසුන දරන්නට ඇතැයි පරණවිතාන මහතා කල්පනා කරයි. (ල.වි.ල.ඉ. 1972, 601) මේ අනුව ඇතැම් ඉතිහාසඥයන් කල්පනා කරන්නේ ක්‍රි.ව. 1326 න් හතරවන පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍ය කාලය අවසන් වන්නට ඇති බවයි. (සිරිවීර, 2002, 122/ රෝහණධීර, 1965, 31/ ලියනගමගේ, 2005, 212)

සමකාලීන ව රචිත මූලාශ්‍රය පදනම් කරගනිමින් වික්‍රමසිංහ මහතා විසින් ශිලා ලේඛන සංග්‍රහය III කාණ්ඩයට සපයා තිබෙන ලංකාවේ පාලකයන්ගේ රාජවර්ෂ සටහනට අනුව කුරුණෑගල පාලකයන්ගේ රාජ වර්ෂය වන්නේ දෙවන භුවනෙකබාහු රජතුමා ක්‍රි.ව. 1293-.1302ත්, හතරවන පරාක්‍රමබාහු රජතුමා ක්‍රි.ව. 1303-1333ත්, තුන්වන භුවනෙකබාහු රජු හා පස්වන පරාක්‍රමබාහු රජු යන රජුන් දෙදෙනා 1333-1347 දක්වාත්ය. (E.Z., Vol III, 27-29) ඒ අනුව හතරවන පරාක්‍රමබාහු රජතුමා ක්‍රි.ව. 1303 සිට 1333 දක්වා වර්ෂ 30ක් සිහසුන් දරා තිබේ. මෙම මත දෙක ම සම්බන්ධ ව අනුමාන නිගමන ඇති හෙයින් නිශ්චිත ව ම කාලනිර්ණයක් දැක්වීම අපහසු ය.

හතරවන පරාක්‍රමබාහු රජතුමා, කුරුණෑගල රාජධානිය පැවැති කෙටි කාල පරිච්ඡේදය තුළ දිර්ඝ කාලයක් සිහසුන දැරූ පාලකයා වූයේය. සමස්ත දිවයින පුරා ම මෙම රජු දේශපාලන ආධිපත්‍යයක් පවත්වා ගෙන ගිය බවට සාධක නොමැත. මේ වනවිට අනුරාධපුරය හා පොළොන්නරුව අභාවයට ගොස් තිබුණු අතර ම පාණ්ඩ්‍ය බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස යාපනය ප්‍රදේශයේ ද්‍රවිඩ රාජධානිය ඇති වී එය සෑහෙන දුරකට බලවත් වී තිබිණි. (සිරිවීර, 2002, 123) ද්‍රවිඩ බලපෑම්

කුරුණෑගල අවධියේ දී එල්ල වූවා යැයි ද අනුමාන කළ හැකි අවස්ථාවක් වේ. නාරන්බැද්ද ශිලා ලිපිය හතරවන පරාක්‍රමබාහු රජුගේ යැයි සැලකුවහොත් (දෙවන පරාක්‍රමබාහු රජුගේ යැයි ද මතයක් පවතී) (ලියනගමගේ, 2005, 262) මායා රටට කඩා වැදුණු ද්‍රවිඩයන් පිරිසක් පරාජය කිරීමට රජු සමත් වී ඇත. (Bell, 1892, 77-88) කෙසේ නමුත් සමකාලීන ව අභ්‍යන්තරික වශයෙන් පැවැති දේශපාලනික තත්ත්වයට අනුව එවැනි ආක්‍රමණශීලි අවස්ථා ඇති නොවූවා යැයි සිතීමට අපහසුය. රට තුළ ස්ථාවර සාමයක් පැවැති බව **මහාවංසයේ** විස්තරවලට අනුව පෙනේ. රජුගේ ආධිපත්‍යය පිහිටි ප්‍රදේශය තුළ සාමකාමී සමෘද්ධිමත් තත්ත්වයක් පවත්වාගෙන ගොස් තිබේ. ශාසනික ප්‍රබෝධයක් ඇති කිරීමට හා සිංහල සාහිත්‍යයේ දියුණුවට රජු නොමඳ සහයෝගය ලබා දී තිබේ. නව පිරිවෙන් ආයතන දෙකක් වූ ශ්‍රී පරාක්‍රමබාහු පිරිවෙන (**දළදා සිරිත**, 1961, 47,48) හා විදාගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන (Cv., XC., 91) ඉදිකිරීම හා තොටගමුවේ විජයබා පිරිවෙන (Cv., XC., 98) දියුණු කිරීමෙන් අධ්‍යාපනයේ වර්ධනයට මහත් රුකුලක් ලැබිණි. එමෙන් ම දෙවුන්දර නන්දන පිරිවෙන, කිත්සිරිමෙවන් කැලණියේ පිරිවෙන හා කෑරගල පද්මාවතී පිරිවෙන මේ කාලයේ දී දීප්තිමත්ව පැවැතුණු බව සැලකිය හැකිය. (සුමනජෝති, 1965, 22) ගලතුරුමුල මාහිමි, මෙධඞ්කර මහාස්ථවිර, සොලි මහාස්ථවිර, විල්ගම්මුල පරාක්‍රමබාහු මහාස්ථවිර, වීරසිංහ පතිරාජ, දෙව්රදදම්පසඟිනා, යන පිරිස උසස් පාණ්ඩිත්වයෙන් හෙබි ගිහි පැවිදි දෙපිරිස අතින් ම සාහිත්‍යයට විශාල මෙහෙවරක් සිදුවිය. (සන්නස්ගල, 1965, 18/ විපස්සි හිමි, 2005, 77-88) පාලකයා වශයෙන් පරාක්‍රමබාහු රජතුමා ලබා තිබූ පාණ්ඩිත්‍යය හා භාෂා සාහිත්‍යය කෙරෙහි ස්වකීය අනුග්‍රහයක් දැක්වීමේ සුවිශේෂත්වය ලාංකික සාහිත්‍ය ඉතිහාසයේ කීර්තිමත් කාල වකවානුවක් බිහිවීමට හේතු වී තිබේ.

අඛණ්ඩ ඉතිහාසය ලිවීමේ සම්ප්‍රදායේ **මහාවංසයේ** 80වන පරිච්ඡේදයේ සිට 90වන පරිච්ඡේදයේ 102 දක්වා ඛණ්ඩයේ කතුවරයා පිළිබඳ ව නිශ්චිත බවක් නොමැති වුවත් හතරවන පරාක්‍රමබාහු රජු දවස ලියන්නට ඇතැයි ද අනුමාන කෙරේ. (මලලසේකර, 1928, 236) ජාතකකථා පොත සිංහල භාෂාවට පෙරළීම සිංහල සාහිත්‍යයේ වර්ධනයේ සුවිශේෂ අවස්ථාවය. **මහාවංසයේ** එය සඳහන් වන්නේ - ඒ සියලු පන්සියපණසක් ජාතකයන් පාළිභාෂාවෙන් ගෙණ සිංහල නිරුක්තියට ක්‍රමයෙන් පෙරළා පිටකත්‍රයධාරිවූ මහාස්ථවිරයන් මැද අස්වා පිරිසිදු කොට ලියවා ලක්දිව සැමතැන පැවැත්වූයේය" යනුවෙනි. (Cv., XC., 83-84) මෙය රජු විසින් ම කළා යැයි **මහාවංසයේ** සඳහන් වෙතත් ඒ පිළිබඳ පවත්නා තවත් අදහස් වන්නේ රජුගේ අනුග්‍රහයෙන් සොළී තෙර ප්‍රමුඛ ගිහි පැවිදි මණ්ඩලයක් මඟින් ග්‍රන්ථය සිංහලට නැගුවා විය යුතුයි යන්නයි. (ජයවර්ධන, 1965, 11) මෙය කතුවරුන්



කීපදෙනෙකු පිළියෙළ කළ පොතකැයි සිතීමට ද ඉඩ තිබේ. (ල.වි.ල.ඉ., 1972, 729) දළදා සමිඳුන්ට කළ යුතු දෛනික පුද පූජා හා වතාවත් ඇතුළත් කොට **දළදා සිරිත** රජු ආරාධනාවෙන් දෙව්රද දම් පසඟිනාවන් විසින් රචනා කරන ලදි. (**දළදා සිරිත** ප්‍රස්තාවනාව) රාජ්‍යයේ සංකේතය වූ ද ලාංකිකයන්ගෙන් පූජනීය වස්තුවක් වූ ද, දළදා වහන්සේ රැකගැනීම මේ දක්වා ම පාලකයාගේ අනුග්‍රහය යටතේ පාරම්පරික ව සිදු වුවත් චාරිත්‍රානුකූල සිරිත් විරිත් ලේඛනගත කිරීමට දැරූ උත්සාහය සාහිත්‍ය වශයෙන් පමණක් නොව ආගමික වශයෙන් ද සිදු වූ වැදගත් මෙහෙවරකි.

ශ්‍රී පරාක්‍රමබාහු විල්ගම්මුල මාහිමියන් **සූර්ය ශතක සන්නයත්** සිංහල භාෂාවෙන් බෝධිවංශය හා **අනාගතවංසයත්**, විද්‍යා චක්‍රවර්ති පරාක්‍රම පණ්ඩිතගේ **සිංහල ස්තූපවංශයත්**, කච්චායන ව්‍යාකරණ පදනම් කරගෙන යක් ගිරි ලෙණ සීලවංස තෙරුන්ගේ **ධාතු මංජුසාව**, **උමංදාව**, **දළදා පූජාවලිය**, **දඹදෙණි අස්න**, **සරජෝතිමාලෛ** (දෙමළ) මෙකල විවිධ ක්ෂේත්‍ර පුරා විහිදී ගිය සාහිත්‍ය ග්‍රන්ථ රැසකි. (ල.වි.ල.ඉ. 1972, 729 / ඩබ්.ජී. අබේසිංහ, 2005, 89-95/ ජයවර්ධන, 1965, 04) මේ අනුව හතරවන පරාක්‍රමබාහු රජු දවස ලංකාවේ ධර්ම ශාස්ත්‍රීය අභිවෘද්ධිය ඇති වීම හා දේශපාලන අතින් ද සාමකාමී වාතාවරණයක් පැවතීම කුරුණෑගල යුගය තුළ තිබූ කැපී පෙනෙන ලක්ෂණ වේ.

තුන්වන විජයබාහු රජතුමාගෙන් ඇරඹෙන දඹදෙණි රාජ පරම්පරාව මේ රජුගෙන් අවසන් වේ. ලාංකික ඉතිහාසයේ ව්‍යාකූල ව අස්ථාවර ව පැවැති තත්ත්ව මඟ හරවා ගනිමින් ලාංකිකයන්ට නායකත්වයක් ලබාදීමට මොවුහු සමත් වූහ. හතරවන පරාක්‍රමබාහු දවස කුරුණෑගල යුගයේ දියුණුවේ උච්චතම වකවානුවයි. එහෙත් සාමකාමී වාතාවරණයක් පවත්වාගෙන ගිය හතරවන පරාක්‍රමබාහු රජුගෙන් එම පරම්පරාව අවසන්වීම අර්බුදකාරී කාල පරිච්ඡේදයට නැවත පත්වීමක් ලෙස ද දැක්වීමට පුළුවන. මේ රජුගේ රාජ්‍ය කාලය අවසන් වූ ආකාරය හා වන්නි භුවනෙකබාහු රජවීම සම්බන්ධ ව **මහාවංසයේ** කිසිදු ගැටලු සහිත බවක් නොපෙනේ. මැදවල සන්නසට අනුව බෝදා මාපාණන්ද නමැත්තෙකු විසින් ඇති කරන ලද කැරැල්ලක් හේතු කොටගෙන ඔහුගේ රාජ්‍ය කාලය අහිමි වූ බවට මතයක් පවති. (ල.වි.ල.ඉ. 1972, 601/ ලියනගමගේ, 1989, 212/ බස්නායක, 2002, 21)

මැදවල සන්නසට අනුව කියවෙන්නේ "කුරුණෑගල් නුවර පරාක්‍රමබාහුසාමීන්ට බෝදා මාපාණන්ද සදිකල තැන ඒ නුවර ........" ආදී වශයෙනි. (E'Z., Vol :V. 471-475) මෙහිදී පැන නගින ගැටලු වන්නේ බෝදා මාපාණන්ද කවුද යන්න හා එම ආරවුලේ දී රජතුමා මිය ගියා ද සිහසුනෙන් නෙරපා දැමුවා ද යන්නයි. මෙම ගැටලු සහිත තත්ත්වය පිළිබඳ වෙනත් කිසිදු මූලාශ්‍රයකින් තොරතුරු හමු නො වේ. තුන්වන භුවනෙකබාහු රජු සම්බන්ධව සාකච්ඡා කිරීමේ දී මැදවල සන්නස කෙරෙහි අවධානය යොමු කිරීමට සිදුවේ.

**මහාවංසයේ** සඳහන් වන්නේ හතරවන පරාක්‍රමබාහු රජුට පසු ව වන්නි භුවනෙකබාහු රජ වූ බවයි. හතරවන පරාක්‍රමබාහු රජුගේ ජීවිතය බේදවාචකයකින් නිම කර යුව රජු, රජ වූවා නම් මොහු වන්නි භුවනෙකබාහු විය යුතු ය. එහෙත් එවැනි ඥාතිත්වය ඉස්මතු වන සාධක කිසිවක් හමු නො වේ. එසේ යුවරජ වූවා නම් දඹදෙණි පෙළපත ද මෙතනින් අවසන්වීමට නො පුළුවන. (මංගල ඉලංගසිංහ, 2005, 22)

මැදවල සන්නසේ එන බෝදා මාපාණන්දෑ කවුද යන්න පිළිබඳ ව ගුණසිංහ මහතා දක්වන විස්තරය සලකා බැලිය යුතුය. බෝදා මාපාණන්ද යනු **මහාවංසයේ** එන කඳලිවාට මාපාණ බවත් මොහු අනුරාධපුරයෙන් ලැබී ඇති ශිලා ලේඛනයක (E.Z.Vol: 111, 286-288) සඳහන් වන විජයබාහු පුත්‍ර ශ්‍රී භුවනෙකබාහු මාපාණන් ලෙස ද හඳුන්වා ඇති බව දක්වමින් මේ සියලු ම නම්වලින් හඳුන්වා ඇත්තේ වන්නි භුවනෙකබාහු රජතුමා යන්නයි. (Gunesingha, 1987, 142-147)

බෝදා මාපාණන්ද කවරෙක්ද? යනුවෙන් සඳහන් කරමින් ඒ පිළිබඳ ව මහාචාර්ය මැන්දිස් රෝහණධීර මහතාගේ අදහස වූයේ පළමුවන භුවනෙකබාහු දවස කැරලි ගැසු වන්නි රාජ කඳලිවාට මාපාණන්දෑ හතරවන පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී කැරලි ගැසූ බෝදා මාපාණන්දෑ, හතරවන පරාක්‍රමබාහු රජුට පසු රජවූ වන්නි භුවනෙකබාහු ද යැයි සිතන්නට අනුකූලතාවක් ලැබෙන බවයි. එසේ අනුබලය ලෙස දක්වන්නේ කඳලිවාට මාපාණන්දෑ වන්නි පාලකයකු ද වූ අතර බෝදා මාපාණන්ද වන්නි පාලකයකු ලෙස සඳහන් නොකළත් මාපාණන් යන්න දෙදෙනාට ම යොදා ඇති බැවින් රජ වූ පසු වන්නි යන්න යොදා භුවනෙකබාහු නමින් බෝදා මාපාණන්දෑ පෙනී සිටි බවයි. (රෝහණධීර, 1965, 32)

මොවුන් කවුරුන් ද යන්න ඒ ඒ පුද්ගලයන් පිළිබඳ ව මූලාශ්‍රයගත තොරතුරු අනුව සලකා බැලිය යුතුය. කඳලිවාට මාපාණ යාපහුවේ රජ පැමිණි පළමුවන භුවනෙකබාහු රජු විසින් පරාජයට පත් කරන වන්නි පාලකයන්ගෙන් එක් අයෙකි. **මහාවංසයේ** -කඳලීවාටය, ආපානය, තිපය, හිමියානකය යනාදි වූ සිංහල වන්නි රජුන් ද පහ කොට ලංකාව සතුරු කටු නැතිකොට ......" යනුවෙන් මේ රජු ගැන සඳහන් කෙරේ. (Cv., XC, 33) පළමුවන භුවනෙකබාහු රජ දවස සිට හතරවන පරාක්‍රමබාහු රජ දවස දක්වා ගතහොත් වර්ෂ (1272-1326) පණහක් ඉක්ම වූ දීර්ඝ කාලයක් ය. මේ කාල පරාසය ගැන මැන්දිස් රෝහණධීර මහතාගේ ප්‍රකාශය වන්නේ කඳලීවාට මාපාණන්ගේ කැරැල්ලේ සිට, බෝදා මාපාණන්ගේ කැරැල්ල දක්වා අවුරුදු හතළිහක් තරම් කාල පරතරයක් ඇති බව සැබෑ වුවත් මේ අවුරුදු හතළිහක කාලය අරාජික කාලයක් වන බවය. අනුමානයෙන් වෙන් කළ අවුරුදු තුනක් ද වංසකථා දෙකක් පමණක් දෙවන භුවනෙකබාහු රජුගේ රාජ්‍ය කාලය වශයෙන් දී ඇති අවුරුදු දෙක වෙනුවට අවුරුදු 9ක් ලෙස ගණන් ගැනීම නිසා ද



මේ කාල පරාසය අවුරුදු තිස් ගණනක් විය හැකිය. එහෙයින් මේ කාල පරාසය පළමුවන භුවනෙකබාහු කල දවස කැරලි ගැසූ වන්නි රාජ මාපාණන් ම ඊට පසු ව හතරවන පරාක්‍රමබාහුගෙන් රාජ බලය උදුරා ගත්තේය යන අදහසට බාධාවක් නොවන බවයි. (රෝහණධීර 1965, 32-33)

මේ සම්බන්ධයෙන් මහාචාර්ය අබයරත්න මහතාගේ මතය වන්නේ පළමුවන අවස්ථාව වනවිට කඳලීවාට මාපාණන්ට වයස අවුරුදු 30ක් පමණ වී නම් හතරවන පරාක්‍රමබාහු රජුට හදි කරන විට ඔහුගේ වයස අවු 80ක් පමණ හෝ ඒ වයස ඉක්මවා සිටි මහල්ලෙකු විය යුතු හෙයින් එබඳු අයෙකු හතරවන පරාක්‍රමබාහු වැනි තරමක ප්‍රබල පාලකයෙකුට "හදි කළේ" යැයි පිළිගැනීම දුෂ්කර බවයි. (අබයරත්න, 2009, 65) කඳලීවාට මාපාණ එතරම් කාලයක් රාජ්‍ය පැහැර ගැනීමට බලා සිටියා යැයි අනුමාන කළ නොහැකි ය. පළමුවන භුවනෙකබාහු රජුගේ මිය යෑමෙන් පසු ව පැවති ආරාජික සමය තුළ ඔහුට සිහසුන පැහැර ගැනීමට අවකාශය ද තිබිණි. ඒ වගේ ම කඳලීවාට වන්නි යන්න යෙදුවා මෙන් ම බෝදා මාපාණන්දෑට ද වන්නි යන්න භාවිත කරන්නට තිබුණ බව හැඟී යයි.

අනුරාධපුර ලිපියේ එන ප්‍රකාශය සැලකිල්ලට ගැනීමේ දී ලංකා ඉතිහාසයේ විජයබාහුගේ පුත්‍රයකු වූ භුවනෙකබාහු නමැත්තෙකු ගැන පළමු ව සඳහන් වන්නේ දඹදෙණි යුගයේ දී ය. ඒ තුන්වන විජයබාහු රජතුමාගේ බාල පුත්‍රයා ය. මොහු වැඩිමහල් පුත් දෙවන පරාක්‍රමබාහු රජ දවස යුව රජු වූයේ ය. (Cv., LXXXii, 4) නැවත මෙම නාමයෙන් යුත් පිය පුතු සම්බන්ධයක් දැකිය හැක්කේ කුරුණෑගල අවසාන පාලකයා වූ පස්වන විජයබාහු රජු හා ඔහු පුත් ගම්පොළ රජ වූ හතරවන භුවනෙකබාහු රජතුමා අතරය. (අස්ගිරි තල්පත, 1969, 7) මාපාණන්ද යන්න මුල් කරගනිමින් ගුණසිංහ මහතා දක්වන්නේ කඳලීවාට මාපාණ භුවනෙකබාහු මාපාණන් හා බෝදා මාපාණන්දෑ භාවිත කර ඇත්තේ පොදු නාමයක් වන මහාදිපාද යන රාජකීය නාමය බවයි. එපමණක් නොව දඹදෙණිය පෙළපතේ සිහසුනට උරුමකම් කී පුද්ගලයන් මහාදිපාද යන්න භාවිත කර නොමැති හෙයින් බෝදා මාපාණන්දෑ දඹදෙණි පෙළපතයට අයත් තැනැත්තෙකු නොවන බවත් පෙනේ. ඒ අනුව මහාදිපාද යන්න යොදාගත් භුවනෙකබාහු වන්නි භුවනෙකබාහු බව ද හැඟේ. (ගුණසිංහ 1987, 142-147) මේ අනුව ගුණසිංහ මහතා අදහස් කරන භුවනෙකබාහු දඹදෙණිය පෙළපතේ හෝ ගම්පොළ පාලකයා නොවන බව පැහැදිලි ය.

**පූජාවලියේ** එන සටහනක් හා **කඳවුරු සිරිත** පාදක කර ගනිමින් මහාදිපාද යන්න සම්බන්ධ ව දක්වන අබයරත්න මහතාගේ මතය අනුව දඹදෙණි පෙළපතේ රජවරුන් මහාදිපාද යන්න භාවිත කර තිබේ. (අබයරත්න, 2009, 63) හතරවන පරාක්‍රමබාහු රජු බලයෙන් පහ කරන ලද්දේ ද? නැතහොත් මරා දමන ලද්දේ දැයි නිශ්චය කළ නොහැකි බවත්

මෙයින් කුමක් සිදු වුවත් බෝදා මාපාණන්දෑ තාවකාලික ව හෝ කුරුණෑගල බලය හිමි කරගන්නට ඇති බව හා මාපාණන්දෑ යන හැඳින්වීමට අනුව නිසැක ව ඔහුට සිහසුන පිළිබඳ ව උරුමයක් පැවැති බව පැහැදිලි වන බවයි. තව දුරටත් මේ ගැන සඳහන් කරමින් වන්නි භුවනෙකබාහු බෝදා මාපාණන්දෑ වීමට ඉතා සුළු ඉඩකඩක් පවතින නමුත් ස්ථිර නිගමනයකට එළඹීමට සාක්ෂ්‍ය නොමැති බව දක්වයි. (අබයරත්න, 2009, 65)

දඹදෙණි යුගයේ රජකම උරුම වූයේ අනුරාධපුර යුගයේ පිළිවෙළට ම යැයි දක්වන පරණවිතාන මහතා ප්‍රකාශ කරන්නේ දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍ය කාලයේ ඔටුන්න හිමි කුමාරයා මාපා හෙවත් මහ ඈපා යන උපාධි නාමය ඇතිව බාල සහෝදර භුවනෙකබාහු සිටි බවයි. රාජ කාලයේ දී ද මේ උපාධි නාමය දරූ කුමාරයෙකු සිටි බව මැදවල සන්නස අනුව පැහැදිලි වන බව තව දුරටත් දක්වයි. ඒ අනුව බෝදා මාපාණන්දෑ වනාහි යුවරාජ වෙන්නට ඇති බව අදහස් කරයි. (ල.වි.ල.ඉ, 1972, 690)

මෙරට දේශපාලන තන්ත්‍රයේ එන මහපා තනතුර පිළිබඳ ව මෙහි දී පරීක්ෂා කළ යුතු ය. පරිපාලන සංවිධාන සම්බන්ධ ව අනුරාධපුර යුගයේ පටන් ම මහපා තනතුර පවත්නා බවට බොහෝ තොරතුරු හමුවෙයි. මේ සම්බන්ධ ව මහාචාර්ය පරණවිතාන, මහාචාර්ය රණවැල්ල වැනි විද්වතුන් සිය අවධානය යොමු කර තිබේ. මහපා, මායා, මාපා, මහයා, මහාදිපාද යන නාමයෙන්ගෙන් හඳුන්වා ඇත්තේ මුල් අවධියේ උපරාජ හෙවත් යුවරජයි. එනම් ඔටුන්න හිමි කුමාරයා ය. මේ පදය සෑදී ඇත්තේ කුමාරවරුන්ගේ උපාධිනාමයක් වූ "අය" යන්න මුලට "මහ" යන්න එකතුවීමෙන් ය. **මහාවංසයේ** මහාදිපාද යන්න මුල්වරට යොදා ඇත්තේ ක්‍රි.ව. 571-604 අවධියේ සිහසුන් දරූ පළමුවන අග්ගබෝධි රජ දවස ය. (ල.වි.ල.ඉ., 1972, 352) රජු බෑන අක්බෝ කුමරුහට මහා ඈපා තනතුර දී (Mv., XLii, 6, 7) සහ "රජහු ඇවෑමෙන් අක්බෝ මහා ඈපා තෙමේ රජවිය" (Mv., XLii, 40) පළමුවෙන් මහා ඈපා වී පසු ව සිහසුනට පත්වීම පිළිබඳ ව **මහාවංසයේ** මෙලෙස සඳහන් වේ.

මුල් අවධියේ මාපාගේ වගකීම වූයේ රුහුණු පාලනයයි. ක්‍රි.ව. 8වන සියවස පමණ වනවිට රුහුණෙහි බටහිර ප්‍රදේශය දක්ඛිණ දේශය නමින් නව පාලන ප්‍රදේශයක් බිහිවීමෙන් පසු මාපාගේ වගකීම වූයේ එම ප්‍රදේශය පාලනය කිරීමයි. (Ranawella, 1999, XI) මොහුගේ පාලන සීමාව වූයේ කලාඔය සිට කළු ගඟ දක්වා විහිදුණු ප්‍රදේශයයි. (හෙට්ටිආරච්චි, 2005, 228) මායා පාලනය කළ ප්‍රදේශය පසු කාලයේ දී මායාරට නමින් ප්‍රකට විය. (ල.වි.ල.ඉ. 1964, 351) මහාදිපාද හෙවත් මහපා නමින් යුවරජ හඳුන්වා තිබෙන බව රණවැල්ල මහතා දෙවන සේන රජුගේ හා දෙවන උදය රජුගේ අවධිය අයත් සෙල්ලිපි ගණනාවකින් ම පෙන්වා දේ. මාතලේ දිස්ත්‍රික්කයේ ඉනාමලුව කෝරලයේ



වියඋල්පත ලිපිය, (Ranawell, 1999, 14.16) කන්දෙපල්ලේ කෝරළයේ ගැරඬිගල පර්වත ලිපිය (Ranawell, 1999, 17.19) පුත්තලම් දිස්ත්‍රික්කයේ රාජවන්නි පත්තුවේ විරදිගොඩ අටපට්ටම් ටැම් ලිපිය, (Ranawella, 1999, 21-24) මඟින් දෙවන සේන රජුගේ මාපා මහින්ද නමැත්තෙකු පිළිබඳ ව කියවේ. **මහාවංසයට** අනුව දෙවන සේන රජු තම බාල සහෝදරයා මිහිඳු උපරජ කර දක්ඛිණ දේශය භාර කළේ ය. (Mv., Li, 7) මේ අනුව වංසකතාවේ උපරජ සෙල්ලිපියෙහි මාපා ලෙස හඳුන්වා තිබෙන බව රණවැල්ල මහතා පෙන්වා දේ.

අනුරාධපුර අවධියේ දී යුවරජ හා උපරජ දෙදෙනෙකු ලෙස කටයුතු කළ අවස්ථා ද තිබේ. එය ගැටලු සහිත අවස්ථාවක් වුවත් **මහාවංසයේ** එම පුවත නිරවද්‍ය ව සඳහන් කර තිබේ. පළමුවන අග්ගබෝධි රජු මුල් අවස්ථාවේ දී මයිල්හු (මාමා) උපරාජ්‍යයෙහි ද සොහොයුරු යුවරජයෙහි ද පිහිටා දකුණු රට දී සේනා සහිත ව පවරා තිබේ. (Mv., XLii, 5-8) මෙවැනි සිදුවීම් තිබුණ ද පොළොන්නරු අවධිය තුළ මුල සිට ම මහපා ඔටුන්න හිමි කුමරු බවට සාධකවලින් පැහැදිලි වේ.

පළමුවන විජයබාහු රජතුමා දාහත්වෙනි වියේ දී යුවරජ හා මහාදිපාද යන උපාධි නාමය ලැබුවේය. (Mv., LXii, 59, LXiii, 1-8) එමෙන් ම මේ රජු බාල සහෝදර වීර බා කුමරහු උපරජ තනතුරෙහි පිහිටුවා දකුණු දෙස දී විධි වූ පරිද්දෙන් ඔහුට සංග්‍රහ කළේ ය. (Mv., Lix, 11) වීරබාහු මියගිය පසු ඈපා තනතුර දරූ ජයබා කුමරුට යුවරජ තනතුර පිරිනැමුවේය. (Mv., Lix, 88) ඈපා තනතුරට රජුගේ පුත් වික්‍රමබාහු කුමරු පත් කර රුහුණේ පාලනය භාර කළේ ය. (Mv., Lix, 89, 90) පළමුවන විජයබාහු රජු මිය ගිය පසු ව පූර්ව චාරිත්‍ර ඉක්මවා යමින් උපරජකම වික්‍රමබාහුට නොදී රජුගේ සොහොයුරිය වූ මිත්තා කුමරියගේ වැඩිමහල් පුත් මානාභරණට දීමට අභ්‍යවිහාරවාසී භික්ෂූහු හා මහ ඇමතියෝ එක් ව ක්‍රියා කළෝ ය. නිශ්ශංකමල්ල රජුගේ රාජ සභා ලිපියට අනුව රාජ සභාවේ අසුන් වෙන් කිරීමේ දී "යුවරජ පදවි ලද මහපා" යනුවෙන් වෙන් කර තිබේ.

අනුරාධපුර යුගයේ සිට පැවැතෙන චාරිත්‍රයන්ට අනුව යුවරජ මාපා හෙවත් මහාදිපාද නාමයෙන් හඳුන්වා තිබෙන බව පැහැදිලි ය. මෙහි දී බෝදා මාපාණන් දෑ මහාදිපාද හෙවත් යුවරජ ලෙස සිටිමින් රජුට විරුද්ධ ව කැරැල්ලක් ඇති කළා වීමට පුළුවන. එහෙත් පැන නගින ගැටලුව මොහු හතර වන පරාක්‍රමබාහු රජුගේ කවුද යන්නයි. සහෝදරයෙකු ද, පුතෙකු ද නැතහොත් වෙනත් ඥාතියෙකු ද යන්නයි. සම්ප්‍රදායානුකූල ව රජකම උරුම වන්නේ සහෝදරයාගෙන් සහෝදරයාට හෝ වැඩිමහල් පුත්‍රයාටයි. රජු හා මොහු අතර පැවති සම්බන්ධතාවන් පිළිබඳ මූලාශ්‍රයගත තොරතුරු නොමැත. එහෙත් බෝදා මාපාණන්දෑ මහාදිපාද හෙවත් යුවරජ ව සිටියා නම් රජු හා ඥාතිත්වයක් පවතින්නට ඇතැයි අනුමාන කළ හැකි ය. මොහු රජුට විරුද්ධ ව හදි කළත් රජු

මියගිය හෝ සිහසුන අහිමි වූ බවක් මැදවල සන්නසේ සඳහන් නො වේ. මොහු මාහාදිපාද ව සිටිමින් රජුට විරුද්ධ ව සිදු කළ කැරැල්ලේ දී බෝදා මාපාණන්ද ජීවිතක්ෂයට පත් වූවා යැයි අනුමාන කළ හැකි ය. හතරවන පරාක්‍රමබාහු රජතුමා බල පරාක්‍රමයෙන් යුත් ප්‍රබල පාලකයකු ලෙස මූලාශ්‍රයගත තොරතුරු අනුව පැහැදිලි වේ. එහෙයින් රජුට කළ අභියෝගයේ දී රජතුමා ජයග්‍රහණය කරන්නට ඇත.

මෙහි දී බෝදා මාපාණන්දැ යුවරජු විය හැකි යැයි විද්වතුන් අනුමාන කරන අදහස පිළිගැනීමට හැකියාව ලැබේ. දඹදෙණි පෙළපත හතරවන පරාක්‍රමබාහු රජුගෙන් අවසන් වන බව පරණවිතාන මහතා කරන නිගමනය පිළිගැනීමට හැකියාවක් ලැබෙනුයේ යුවරජ ජීවිතක්ෂයට පත් වූ පසු ව හතරවන පරාක්‍රමබාහු රජුගේ වෙනත් අනුප්‍රාප්තිකයෙකු නොසිටි බව පිළිගතහොත් පමණි. එවැනි අනුමානයක් කිරීමට අවකාශ තිබේ. බෝදා මාපාණන් ද යුවරජ ව සිට රජ වූවා නම් ඔහු අයත් වන්නේ දඹදෙණි පරපුරට ම ය. එසේ වුවහොත් දඹදෙණි පරම්පරාවෙහි ආරම්භකයා වන්නි පාලකයකු වූ බැවින් භුවනෙකබාහු වන්නි යන්න යොදා ගැනීමේ ගැටලුවක් ද නොමැත.

මේ අනුව අවසාන වශයෙන් කිව හැක්කේ බෝදා මාපාණන් දැ හතරවන පරාක්‍රමබාහු රජු යටතේ යුවරජ ව සිටිමින් ඇති කළ කැරැල්ලෙන් ජීවිතක්ෂයට පත්වන්නට ඇති බවයි. ඒ අනුව ගතහොත් හතරවන පරාක්‍රමබාහු රජුගෙන් දඹදෙණි පෙළපත අවසන් වී තිබේ. ඒ වාගේ ම මෙහි දී රජුගේ අවසානය පිළිබඳ ව **මහාවංස** සඳහන ද වැදගත් වේ. **මහාවංසයට** අනුව හතරවන පරාක්‍රමබාහු රජු කිසිදු වියවුලකින් තොර ව ජීවිතක්ෂයට පත් වූ බව සඳහන් වේ. (Mv., XC, 105)

හතරවන පරාක්‍රමබාහු රජු ඇවෑමෙන් සිහසුනට පත් වූ තැනැත්තා සම්බන්ධ ව **මහාවංසයේ** දක්වා ඇත්තේ මෙසේ ය. "ඒ රජු ඇවෑමෙන් වන්නි භුවනෙකබාහු නම් නරේන්‍ද්‍රයෙක් තෙමේ ද වූයේ ය" යනුවෙනි. (Mv., XC, 105) කිසිදු වියවුලකින් තොර ව හතරවන පරාක්‍රමබාහු රජතුමාගේ රාජ කාලය නිම වී තුන් වන භුවනෙකබාහු රජ වූ බව මෙයින් හැඟේ. රාජනාමාවලියේ තුන්වන භුවනෙකබාහු නමින් හඳුන්වා ඇත්තේ වන්නි භුවනෙකබාහු රජතුමාය. (Mv., XC, 105) (**රාජරත්නාකරය** 1995, 119)

භුවනෙකබාහු රජු සම්බන්ධයෙන් තොරතුරු සෙවීමේ දී "වන්නි" යන වචනය වැදගත් වේ. ලංකා විශ්වවිද්‍යාලයේ **ලංකා ඉතිහාසය** කෘතියේ දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා සභ්‍යත්වය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී රජයේ වැදගතුන් යටතේ පරණවිතාන මහතා වන්නින් සම්බන්ධ ව කරුණු දක්වා තිබේ. රාජධානියේ ඈත පෙදෙස් පාලනය කෙළේ වන්නි නමින් දක්වන අධිපතීන් විසිනි. ඔවුහු සමහර විට රජතුමාගේ අණට කීකරු නො වූහ. මේ යුගයේ දී තව තවත්



කැලෑවට යටවෙමින් පැවැති පැරණි රජරට විසූ මිනිසුන්ගේ අධිපතීහු වන්නි නම් වූහ. මොවුන්ගෙන් සමහරු ද්‍රවිඩයෝ වූහ. මේ වන්නිවරු රටේ දේශපාලන තත්ත්වය වෙනස්වීම අනුව සිංහල රජුට හෝ යාපනේ රජුට පක්ෂපාත වූහ. "වන්නි" යන වචනය සංස්කෘත හෝ පාලි වන ශබ්දය මුල් කොට ගත්තා යැයි සලකනු ලැබේ. බෙහෙවින් ම වනගත ව පැවති පෙදෙස් පාලනය කළ නිසා ඔවුන් වන්නි නම් වූ බව සලකනු ලැබේ. මෙවැනි වන්නි අධිපතීන් දකුණු ඉන්දියාවේ සිටි බව එරට ඇති සෙල්ලිපිවලින් කියවෙන බව තව දුරටත් සඳහන් කරමින් වන්නි යන වචනය **චූලවංසයේ** පළමුවරට දක්නට ලැබෙන්නේ තුන්වන විජයබාහු රජුගේ කාලය පිළිබඳ විස්තරයේ දී බව පෙන්වා දෙයි. (ල.වි.ල.ඉ. 1972, 695)

පරණවිතාන මහතාගේ අදහස දක්වන කොඩ්රින්ටන් පවසන්නේ "වන්නියාර්වරුන් යනු ප්‍රථම වරට දහතුන් වැනි සියවසේ දී පමණ සාහිත්‍යමය මූලාශ්‍රයවල සඳහන් වෙන වැඩවසම් ප්‍රධානීන් කොටසකි. කිසියම් වනගත ප්‍රදේශයක පාලකයා යන්න එම පදයෙන් අර්ථවත් වේ" යනුවෙනි. (හෙට්ටිආරච්චි, 2005, 387) දකුණු ඉන්දියානු සෙල්ලිපි ඇසුරු කර ගනිමින් වන්නි යන්න පිළිබඳ ව විග්‍රහයක් කරන පද්මනාදන් මහතා සඳහන් කරන්නේ චෝළ අධිරාජ්‍යයෙහි තොණ්ඩෙයි මණ්ඩලම්හි විසූ දේශීය ප්‍රධානීන්ගේ පැරණි පවුල්වලින් පැවතෙන පරම්පරාවන් කීපයක් වන්නියාර්නායන් (වන්නියාර්නායන් ප්‍රධානියා) තනතුරු දැරූ බවත් වන්නියාර්නායන් ප්‍රධානීන් බොහෝ දුරට පරම්පරානුගත ව උරුම වූ පාලන ඒකක මත අධිකාරිත්වය දරා තිබේ. ඔවුන්ගෙන් සමහරු බෙහෙවින් ම බලවත් වූ අතර සැලකිය යුතු තරම් විශාල දේශ සීමා ප්‍රදේශයන් මත පාලන බලය පැතිරවූහ. ඔවුහු තමන්ගේ ම හමුදා පවත්වාගෙන ගියහ. ඔවුන්ගේ වගකීමක් වූයේ අවශ්‍යතාව පැන නැගුණු විට තමන්ගේ චෝළ රජුට හමුදාව සැපයුම් කළ වෘත්තීයමය රණශූර කුලයක් ලෙස වෙන ම සමාජ කණ්ඩායම් වශයෙන් කටයුතු කළ පිරිසක් යන්නයි. ඒ වාගේ ම දකුණු ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ දෙමළ දිස්ත්‍රික්කවල වන්නි ප්‍රධානීන් සඳහා පොදුවේ යෙදූ වන්නියනාර් යන පදය මූලික වශයෙන් සෙන්පතියකුගේ නිලය දැක්වීමට යොදන ලද මිලිටරි නාමය වූ වන්නියර්නායන් යන පදයෙන් බිඳී ආවක් ලෙස සිතිය හැක. මෙම ප්‍රවණතාව සෙන්පතියා ප්‍රාදේශීය බලය ක්‍රියාවේ නංවන වැඩවසම් ප්‍රධානියකු බවට පත් වූ ප්‍රගතිශීලී වර්ධනීය ක්‍රියාකලාපයක ප්‍රතිඵලයකි. කෙසේ වෙතත් ක්‍රමයෙන් පදවියේ මුල් හැඳින්වීම අමතක ව ගොස් කාලයත් සමග එය වැඩවසම් ප්‍රධානියකු හැඳින්වීමට පමණක් යොදාගති. ක්‍රි.ව. 13 සියවස අගභාගයේ දී වන්නියාර් හා වන්නිරාජා විරුදයන් වන්නියාර් කුලයේ ප්‍රධානීන්ට පමණක් ම සීමාවීම තව දුරටත් සිදු නො විණි. එය වියළි කලාපයේ ඕනෑ ම වැඩවසම් ප්‍රධානියකුගේ නිලය හැඟවීමට පටන් ගත් අතර එවන් ප්‍රධානීන්ගේ අධිකාරිත්වයට යටත් වූ ඉඩම් එක් ව ඒකක ලෙස ගෙන වන්නි ලෙස ප්‍රකට විය.

දක්ෂ යුද්ධ භටයන් වූ මොවුන් දකුණු ඉන්දියානු සේනාංක සමග එනම් චෝළ පාලන පසුකාලීන යුගයේ දී මෙරට පැමිණි සේවා භුක්තිය මත දුන් ඉඩම් අයිතියෙන් මුල් වරට වන්නි පාලන ඒකක බිහි වී යැයි සිතිය හැකිය. එමෙන් ම මධ්‍යම අධිකාරියෙහි ග්‍රහණය ලිහිල්වීම ස්වදේශීය මට්ටමේ මෙම ප්‍රධානීන්ගේ බලය හා අධිකාරිත්වය වර්ධනය වීමේ ප්‍රවණතාවන් ඇති වූ අතර මාඝගේ ආක්‍රමණයේ ප්‍රතිඵලය දේශපාලන බල කේන්ද්‍රස්ථාන ලෙස වන්නි පාලකයන් හිස ඔසවමින් දිවයිනේ දේශපාලන හා පරිපාලන කළමනාකරණයෙහි ලා ඉතා වැදගත් භූමිකාවක් ඉටු කිරීමට පටන් ගෙන ඇති ආකාරයයි. (Pathmanadan, 1978, 121-131)

සිංහල, පාලි හා ද්‍රවිඩ මූලාශ්‍රය අනුව යමින් වන්නි ප්‍රධානීන් හා වන්නි ප්‍රදේශ පිළිබඳ ඉන්ද්‍රපාල මහතා ප්‍රකාශ කරන්නේ ක්‍රි.ව. 12 සියවස අවසන් භාගයේ හා ක්‍රි.ව. 13 සියවස මුල් කාර්තුවේ ලංකාවේ සිහසුන අපේක්ෂා කළ පිරිස් හා දකුණු ඉන්දියානු ආක්‍රමණිකයන් වන්නියාර් නම් වූ දකුණු ඉන්දියාවේ යුද්ධ භටයන් හා සම්බන්ධ කුලයේ පිරිසගෙන් කුලී හේවායන් ලෙස ලබා ගැනීම නිසා මෙරට පැමිණි මොවුන් ලංකාවේ ඇතැම් ප්‍රදේශවල පදිංචි වූ බවත් ය. (Indrapala. 1970, 111-140)

වන්නි ප්‍රධානීන් ගැන දේශීය වංසකතාවල දක්වෙන්නේ ඉතා සංක්ෂිප්ත වාර්තා වුව ද මේ වාර්තා ඓතිහාසික ව වැදගත් වේ. මෙම සඳහන්වලට අනුව වන්නි ප්‍රධානීන්ට ඔවුන්ගේ ම පෞද්ගලික හමුදාවක් තිබිණි. දිවයිනේ ප්‍රධාන රජුගේ පාලනයෙන් ඔවුන්ගේ පාලනය බොහෝ දුරට ම ස්වාධීන විය. නමුත් ප්‍රබල රජුන්ගේ කාලයන්හි දී රජුට යටත් වීමට පෙර ඔහුට පක්ෂපාතිත්වය දැක්වීමට හෝ ඔවුන්ට සිදු විය. ඔවුන්ගේ බලය බොහෝ දුරට ම දක්නට ලැබුණේ ක්‍රි.ව. 13, 14 හා 15වන ශතවර්ෂයන්හි දී ය. සිංහල හා ද්‍රවිඩ රාජ්‍යයන් අවසානයේ දී යුරෝපීන්ට ගොදුරු වන තෙක්ම වන්නි ප්‍රධානීන් විවිධ මාදිලියේ ප්‍රාදේශික බලතල භුක්ති විඳිනු ලැබුවේ යැයි සිරිවීර මහතාගේ අදහසය. (සිරිවීර, 2002, 116)

වන්නි යන්න පිළිබඳ ව විග්‍රහයක යෙදෙන ලියනගමගේ මහතා දක්වන්නේ මුල දී වන්නි රාජ යන්නෙන් අදහස් කරන්නට ඇත්තේ වනගත ප්‍රදේශයක පාලනයට පත් වූ ප්‍රාදේශීය නායකයෙකු විය හැකි බවයි. එහෙත් කල් යාමේ දී වනගත ප්‍රදේශවල ආධිපත්‍යය ඇති කරන්නවුන් පමණක් නොව වෙනත් ස්වාධීන හා අර්ධ ස්වාධීන ප්‍රාදේශීය නායකයන් ද හසු වන පරිද්දෙන් එම පදයේ අර්ථය පුළුල් වන්නට ඇතැයි සිතිය හැකිය. (ලියනගමගේ, 1989,137)

යූ.බී. කරුණානන්ද මහතා මේ සම්බන්ධ ව අදහස් දක්වා ඇත්තේ නුවරකලාවිය සමාජ සංවිධානයේ ඉහළ ම ස්තරය ලෙස සැලකුණේ වන්නිවරුන් බවය. මාඝගේ කුලීන ජන සංහාරයට හසු නොවී පැනගත් පිරිස කලක් වනගත ව සිට ඔහුගේ බලය තුරන් වූ පසු ආපසු පැමිණ යළිත් සමාජ නායකත්වය භාර ගත්හ. එතැන් පටන් වන්නිවරුන් ලෙස හැඳින්වූ මොවුහු දඹදෙණි යුගයේ සිට එන කාල පරිච්ඡේදය මුළුල්ලේ නුවර කලාවිය හා තමන්කඩුව ඇතුළත් පැරණි රජරට ශිෂ්ටාචාරයේ මුල්බිම් ප්‍රදේශවල සමාජ නායකත්වය හා ප්‍රභූත්වය ඉසුලූහ. (කරුණානන්ද, 1993, vi)



පාලි මූලාශ්‍රය අනුව ලංකා ඉතිහාසයේ ''වන්නි'' යන පදය මුලින් ම හමුවන්නේ තුන්වන විජයබාහු රජු සම්බන්ධ ව එන ප්‍රවෘත්තියක බව බොහෝ උගතුන් පිළිගන්නා මතයයි. **මහාවංසයට** අනුව "විජයබාහු යයි ප්‍රසිද්ධ වූ රජතෙම පසමිතුරු බියෙන් ඒ ඒ මහාවනයට දුර්ගයට පිවිස බෝකල් වැස වන්නි රජ බවට පැමිණියේ සියලු ම සිංහලාමාත්‍යයන් තමන් වසඟ කොට මහ බලැත්තේ සිංහල සේනාව සමඟ නික්ම මහාතේජස්කන්ධයක් අඳුරු සෙමින් යුද පිණිස සැදුණු චතුරඟ සමන්විත වූ සියලු පසමිතුරු සෙන් වැනසුයේ ය. කැමති පරිද්දෙන් ගමෙක් ගමෙක්හි ගෙයක් ගෙයක් පාසා වාසය කරන්නාවූ සියලු ම ද්‍රවිඩ යෝදයන් ඒ ඒ තැනින් පලවා විය. ඒ ප්‍රධාන මායාරට සතුරු කටු පහකොට එහි අතිශයන් උස් වූ දඹදෙණි පව් මතුමෙහි මනරම් සව්රුවාසල් යුක්ත වූ රම්‍ය වූ පුරයක් කරවා එහි සැපසේ වෙසෙමින් ඒ මහිපතිතෙම රජ කළේය" යනුවෙනි. (Cv., Lxxxi, 11-16) සතුරන්ට බියෙන් දුර්ග සහිත වනාන්තර ප්‍රදේශයක රැකවරණයෙන් යුතුව වාසය කරමින් එහි සිට වන්නි නම් නායකත්වයට ඇති කර ගැනීම විජයබාහු රජුගේ දේශපාලන ගමන් මඟෙහි පළමු පියවර විය. එයින් පසු ව බොහෝ අභියෝග මැඩ මහත් පරිශ්‍රමයකින් යුතුව මායා රටේ අධිපතියා බවට පත් විය.

**මහාවංසයේ** "එම රාජාන්තරයේදී බොහෝ වූ මහා පින්වත් ජනයා ඒ ඒ මහාදුර්ග පර්වතයන්හි නගර ග්‍රාමයන් කරවා ඒ ඒ තැන වෙසෙමින් ලෝකය ද ශාසනය ද නිරවුල් කොට පාලනය කළේය. රැ යන්නෙන් හා (Cv., Lxxxi, 1-3) **හත්ථවනගල්ල විහාරවංසයෙහි** සඳහන් වන එසේ ම සතුරු සේනාවන්ගෙන් පීඩාවට ලක් වු මැති ඇමැති ආදී වූ ජන ප්‍රධානින් හා වෙනත් ජනී ජනයන් දසදහස් ගණනින් ස්වකීය ගම් හා නගර හැර පියා රැකවරණය පතා වනදුර්ග ගිරි දුර්ග සොයා ගියා, (**හත්ථවනගල්ලවිහාරවංස**, 1996, 63) යන්නේ එකල රටවැසියන් මුහුණ දුන් පසුබිම ආශ්‍රයෙන් මධ්‍යකාලීන ලංකාවේ ප්‍රධාන දේශපාලන සාධකයක් වූ වන්නි රාජ්‍ය බිහි වීම මැනවින් මෙමඟින් තේරුම් ගත හැකි ය. (ඉලංගසිංහ, 2005, 13) මාඝ ව්‍යසනයෙන් රාජාන්තරයක් ඇතිවීමෙන් ලාංකිකයන් තම තමන්ට හැකි අයුරින් කුඩා කණ්ඩායම් ලෙස විවිධ දුෂ්කරතා ඇති ප්‍රදේශයන්හි වාසය කරමින් ආරක්ෂාව සලසා ගෙන තිබේ.

**පූජාවලිය** වන්නි පාලකයන් බොහෝ දෙනෙකු සිටි බව "විජයබාහු නම් රජ මායාරජයෙහි හිඳ වැසි අන්ධකාරයෙහි තේජෝ කඳක් සේ

පැන නැගී සිංහල බල පිරිසක් ගෙන දෙමළ හටයින් ඒ ඒ තැන්හි මහවන්නි වැ වසන බලි සිංහලයන් තමහට වසඟයන් ගෙන අවසඟයෙන් සාධා ගම ගම හුන් දෙමළුන් පොළොන්නරු වැ දක්වා මරා ලුහුබැඳ මායා රජය තැන්කොට එහි ජම්බුද්‍රෝණි නම් පුරයක් කරවා" පෙන්වා දේ. (**පූජාවලිය**, 1986, 789) එපමණක් නොව මාඝට බියෙන් මේ පිරිස් වාසය කර තිබේ. වන්නි පමණක් නොව මහවන්නි නමින් ද ප්‍රභේදයක් තිබූ ආකාරයක් පෙන්නුම් කෙරෙන හෙයින් මුල දී විජයබාහු රජු වන්නි පාලකයෙකු ව සිට බලවත් වෙමින් මහවන්නින් ද පරාජය කළ බව පැහැදිලි ය. වන්නි පාලකයන් බොහෝ දෙනෙක් පාලන තන්ත්‍රයේ සිටි බව හා තුන්වන විජයබාහු රජුට අවනත කර ගැනීමට නොහැකි වූ පිරිස් ද සිටි බව දෙවන පරාක්‍රමබාහු රජ දවස එතුමාට ද වන්නි පාලකයන් යටත් කර ගැනීමට සිදුවීමෙන් පැහැදිලි වේ. ඒ බව "නොයෙක් යුද්ධ කරන්නාහු පිය රජ දවස සාධා ගත නුහුණු සිංහල මහවන්නින් තවත් හුන් පොළ හිඳ ම සාධා නොයෙක් රටවල් ගෙන ලක්දිව සිංහල බලසෙන් තමන් කරාම රැස්කොට යැයි" **පූජාවලියේ** සඳහන් කෙරේ. (**පූජාවලිය**, 1986, 789)

සිංහල වන්නීන් බලවත් ස්වාධීන පාලකයන් වුවත් ඔවුහු සිංහල රජෙකුට සහයෝගය දීමට පසුබට නො වූහ. දෙවන පරාක්‍රමබාහු රජු මෙසේ වන්නි රජු ස්වකීය ආධිපත්‍යයට නතු කර ගැනීමට කටයුතු කර ඇත්තේ මාඝ පලවා හැරීමේ ක්‍රියාකලාපයේ මුල් අදියර ලෙසටයි. (Cv., Lxxxiii, 11-35) සිංහල වන්නිහු සේනා වාහන සමන්විත බලවත් පිරිසක් වූහ. යුද්ධයෙන් මෙන් ම විවිධ උපක්‍රම යොදා ද මොවුන් දිනා ගැනීමට රජු සමත් වූයේය. මාඝ පලවා හැරීම සඳහා පිහිටි රට සිංහල මහ වන්නීන්ගෙන් සහයෝගය ලැබුණි. එහෙයින් නගරය ප්‍රතිසංස්කරණයෙන් පසු ව එහි ආරක්ෂාව ඔවුන්ට භාරදුන්නේය. (Cv., Lxxxiii, 87-89)

දෙවන පරාක්‍රමබාහු රජුගේ වැඩිමහල් පුත් අනුරාධපුර නගරය ප්‍රතිසංස්කරණයට ගිය විට පෙර නොයෙක් වර යුද්ධයෙහි පිහිටි රට මහ වන්නි රජුන් අල්වා ගෙන කස්තිර කොට ගත් අඹුදරුවන් ආපසු භාර දීමෙන් වන්නි පාලකයන් සමඟ යුද්ධ කර තිබෙන අයුරු පෙන්නුම් කරයි. (**පූජාවලිය**, 1986, 802) **පූජාවලියේ** සඳහන් වන ''දෙවන පරාක්‍රමබාහු රජු මායා රජයෙහි හිඳ තුන් රජය එක්සේසත් කරගැනීමේ දී වන්නි පාලකයන් යටත් කරගත් අයුරු ''නොයෙක් මහවන්නීන් ගෙන්වා මා පාමුල්හි රැස් කරවාපීය'' යන්නෙන් තව දුරටත් පැහැදිලි වේ. (**පූජාවලිය**, 1986, 802)

වන්නි පාලකයන් මායා, පිහිටි දෙරට පමණක් නොව රුහුණු රට ද වාසය කළේ ය. දෙවන පරාක්‍රමබාහු රජ දවස මහවැලි ගඟේ දාස්තොට දී පැවැත්වූ උපසම්පදා උත්සවයට රුහුණු සහ පිහිටි රජ වන්නි රජවරු පූජා භාණ්ඩ රැගෙන සහභාගි වූහ. (**පූජාවලිය**, 1986, 804) දඹදෙණියේ



රජ කළ පාලකයන්ට විවිධ උපක්‍රම යොදමින් වන්නි පාලකයන්ගේ සහයෝගය ලබාගැනීමට සිදුවිය. වන්නි පාලකයන් යටතේ වන්නි පාලන ඒකක හෙවත් ප්‍රාදේශීය මට්ටමේ ඒකක බොහොමයක් තිබී ඇත. ස්වාධීන ඒකක වූ මේවා බලවත් මට්ටමින් පැවැතුණු බව ද අදහස් කළ හැකිය. වන්නි පාලකයන්ගේ බලය විටින් විට වර්ධනය වූ ආකාරය පළමුවන භුවනෙකබාහු රජු දවස කදලීවාට, ආපාන, තිපය හා හිමියාන්කය ආදී සිංහල වන්නිවරුන් රජුට විරුද්ධ ව කැරලි ගැසීමෙන් පෙන්නුම් කරයි. (Cv., xc, 33-34)

වන්නි පාලකයන් සම්බන්ධ ව දක්වෙන තොරතුරු අනුව මොවුන් ක්‍රි.ව. 13වන ශතවර්ෂයේ මධ්‍යගත පාලන තන්ත්‍රය විනාශ වීම නිසා දේශපාලන තන්ත්‍රය තුළ අලුතින් බිහි වූ නායකයින් පිරිසක් බව පැහැදිලි ය. අරාජික තත්ත්වයක් යටතේ මෙවැනි නායකයන් බිහිවීම ස්වභාවයෙන් සිදු වන්නකි. මාඝ ව්‍යසනයේ අත්දැකීම් ලැබූ ලාංකිකයන් ඊට බියෙන් තැනින් තැන ඒකරාශි වී නායකත්වයක් ඇති කර ගැනීමක් සිදු වී තිබේ. මේ තත්ත්වය සිංහල පමණක් නොව ද්‍රවිඩ ජන කණ්ඩායම් අතර ද සිදු වන්නට ඇත. එය දකුණු ඉන්දියානු ආභාසයෙන් සිදු වූවක් වීමට මෙන් ම නොවීමට ද ඉඩ තිබේ. ද්‍රවිඩ පිරිස් අතර නායකත්වයක් ගැනීමට තරම් බලවතුන් වන්නට ඇත්තේ දකුණු ඉන්දියාවෙන් පැමිණි කුලී හේවායන් විය හැකි ය. මාඝට බියෙන් වනගත වූ පිරිස් අතර නායකත්වය මුලින් ම බිහිවන්නට ඇති හෙයින් එය 'වන්නි' යන අර්ථය ගැන්වූවා විය හැකි ය. නමුත් මාඝ වියවුල නිසා ද අනුරාධපුර පොළොන්නරු ප්‍රදේශ වනාන්තර බවට පත් වීම සිදු විය. රුහුණු රට අනුරාධපුර යුගයේ පටන් ම දේශපාලන තන්ත්‍රය තුළ විශේෂිත ප්‍රදේශයක් විය. බොහෝ දුරට අනුරාධපුර පාලකයන්ගේ ආරක්ෂිත ස්ථානයක් මෙන් ම අනුරාධපුර පොළොන්නරු යුගයන්හි බලවතුන්ගේ මුල් භූමියයි. රුහුණු රට තුළ ද වන්නීන් බිහිවන්නට ඇත්තේ නව දේශපාලන ප්‍රවණතාව නිසා විය යුතුයි. ඒ අනුව සමස්තයක් ලෙස ලංකාව පුරා ම ක්‍රි.ව. 13 සියවසේ ඇති වූ නව දේශපාලන ලක්ෂණය ලෙස ප්‍රාදේශීය රාජ්‍ය ඇති වීම සිදුවූ බව පෙන්නුම් කළ හැකිය.

ඒ වගේම දඹදෙණි පරපුරේ ආරම්භක පාලකයා වන්නිවරයෙකු වුවා මෙන් ම අනෙක් වන්නිවරුන්ගේ නැගී සිටීම් වැළැක්වූ බව ද පෙනේ. නමුත් වන්නි පාලකයන්ගේ නැගී සිටීම් වරින් වර සිදුවීමේ ප්‍රතිඵලයක් ලෙස කුරුණෑගල හතර වන පරාක්‍රමබාහු රජු මිය ගිය පසු ව වන්නි භුවනෙකබාහු රජුගේ නැගී සිටීමෙන් ප්‍රකට වේ. ඒ අනුව තුන්වන භුවනෙකබාහු යනු වන්නි පාලකයකුගේ බලවත් වීමක් යැයි නිගමනය කළ හැකිය. තුන්වන භුවනෙකබාහු නව වන්නි පරම්පරාවක ආරම්භකයා වුවත් ඔහුගේ අනුප්‍රාප්තිකයන්ට දඹදෙණි පරපුරේ මෙන් ඉදිරියට යෑමට අවකාශයක් නොලැබුණි. අන් රජුන්ටත් වඩා අවිනිශ්චිත බවක් තුන්වන භුවනෙකබාහු රජුගේ කාලය සම්බන්ධ ව පවතී.

ලංකා විශ්වවිද්‍යාලයේ **ලංකා ඉතිහාසය** කෘතියේ එන රාජ නාමාවලියේ වර්ෂ සකස් කිරීමේ දී හතරවන පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍යකාලය ක්‍රි.ව. 1326න් අවසන් කර තුන්වන භුවනෙකබාහු රජුගේ රාජවර්ෂ සඳහන් කිරීමක් නොකර පස්වන විජයබාහු රජුගේ රාජවර්ෂ ක්‍රි.ව. 1335-1341 ලෙස දක්වයි. (ල.වි.ල.ඉ, 1972. 807) තුන්වන භුවනෙකබාහු හා පස්වන විජයබාහු යන රජුන් දෙදෙනාගේ ම රාජවර්ෂ ක්‍රි.ව. 1333-1347 ලෙස සමකාලීන ව සිහසුන් දරූ ආකාරයක් වික්‍රමසිංහ මහතාගේ සටහනේ දක්වේ. (E.Z.Vol. III, 27-29) විද්වතුන් තුන්වන භුවනෙකබාහු කාලය විවිධාකාරයෙන් දක්වා තිබේ. ක්‍රි.ව. 1334-1335 (සුමනජෝති, 1965, 19) ක්‍රි.ව. 1327-1335 (අබයරත්න, 2009, 71) හතරවන පරාක්‍රමබාහු රජතුමාගේ අවසාන වර්ෂය ක්‍රි.ව. 1326 ලෙසත් තුන්වන භුවනෙකබාහු සම්බන්ධ ව වර්ෂ සඳහන් නොකර පස්වන විජයබාහු කාලය ක්‍රි.ව. 1335-1341 ලෙස දක්වීම හතරවන පරාක්‍රමබාහු රජුගෙන් පසු ව තුන්වන භුවනෙකබාහු රජ හා පස්වන විජයබාහු රජ රජවූ බව සඳහන් කර වර්ෂ සඳහන් නොකිරීම (සිරිවීර, 2002, 221) එවැනි අවස්ථා කිහිපයක් ය.

**දළදා සිරිත** ලියනු ලැබූ ක්‍රි.ව. 1325 වර්ෂයේ දී හතර වන පරාක්‍රමබාහු රජු සිංහාසනයේ සිටි හෙයිනුත් ඊළඟට ලංකා ඉතිහාසයේ නිශ්චිත දිනය ලෙස ගඩලාදෙණිය හා ලංකාතිලක ලිපි අනුව හතරවන භුවනෙකබාහු රජුගේ තුන්වන රාජ වර්ෂය ශක වර්ෂ 1266 එනම් ක්‍රි.ව. 1344 නිසා (ල.වි.ල.ඉ, 1972, 602) මේ අතර කාල පරිච්ඡේදයේ හතරවන පරාක්‍රමබාහු රජුගේ අවසාන වර්ෂය හා ඔහුගේ අනුප්‍රාප්තිකයන්ගේ රාජවර්ෂ ගණනය කිරීමේ දී විවිධ මත මෙන් ම ඒවායින් නිශ්චිත දිනයක් පිළිබඳ නිගමනයකට පැමිණීම අපහසු ය. ඉහත සඳහන් රාජවර්ෂ විද්වතුන් දක්වීමේ දී ඊට පාදක කරගත් විවිධ හේතු තිබෙන බව ද පැහැදිලි යි.

**මහාවංසයේ** එන හතර වන පරාක්‍රමබාහු රජුට පසු ව වන්නි භුවනෙකබාහුත් ඔහුට පසු ව මහබලැති ජයබා (පස්වන විජයබාහු) රජ වූ බව එන සඳහන හැරුණු විට ශකවර්ෂ 1252 වන ක්‍රි.ව. 1330 වැන්නේ දී නිකුත් කරන ලදැයි සැලකෙන අල්ගම් වෙහෙර සන්නස තුන්වන භුවනෙකබාහු රාජ සමයට අයත් යැයි පරණවිතාන මහතා අදහස් කරයි. මේ ලේඛනය හැරුණු විට මේ රජු සම්බන්ධ ව වෙනත් කිසිදු ඓතිහාසික මූලාශ්‍රයක් හමුවී නොමැත. ඉතිහාසගත ලිඛිත තොරතුරු අල්ප බැවින් රජු සම්බන්ධ ව බොහෝ දෑ වැළලී ගොස් තිබෙන්නට ඇත. එහෙත් රජු සම්බන්ධ ව වන්නි හත්පත්තුවේ ජනකතා බොහොමයක් පවතී. වන්නි පාලකයකු සිහසුනට පත් වූ අවස්ථාවක් හැටියට තුන්වන භුවනෙකබාහුගේ රාජපදප්‍රාප්තිය සඳහන් කිරීමට මේ අනුව හැකියාවක් පවතී.



## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


01. **අස්ගිරියේ තල්පත**, සංස්: රෝහණධීර, මැන්දිස්, (1969), විද්‍යෝදය විශ්වවිද්‍යාලය.
02. **දළද සිරිත**, (1961), සංස්: සෝරත හිමි, වැලිවිටියේ., ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.
03. **පූජාවලිය**, (1986), සංස්: ඤාණවිමල හිමි, කිරිඇල්ලේ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.
04. **මහාවංසය**, (1995), ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ.
05. **රාජරත්නාකරය**, (1995), සංස්: රූපසිංහ, කරුණාදාස., චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය.
06. **රාජාවලිය**, (1997), සංස්: සුරවීර, ඒ.වී., අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
07. **සන්න සහිත හත්ථවනගල්ල විහාරවංසය**, (1996), සංස්:, ධම්මරතන හිමි, උතුරාවල, කැලණිය.
08. Culavamsa, ed: Geiger, (1925, 1927), Wilhelm, Vol: 2, (PTS), London.

01. අභයවර්ධන, එච්.ඒ.පී. (1978), **කඩයිම් පොත් විමර්ශනය**, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ.
02. අබයරත්න, ඒ.එච්.එම්.එච්., (2009), **ගම්පොළ යුගය**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
03. අබේසිංහ, ඩබ්ලිව්.ඒ. (2005), **පොතපත**, පි., 89-95, **කුරුණෑගල්පුර යුගය**, සංස්: දෙගම්මැද සුමනජෝති හිමි, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.
04. ඉලංගසිංහ, මංගල, (2005), **ඓතිහාසික මූලාශ්‍රයෝ**, පි., 21-29, **කුරුණෑගල්පුර යුගය**, සංස්: දෙගම්මැද සුමනජෝති හිමි, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.
05. ඉලංගසිංහ, මංගල, (1996), කුරුණෑගල්පුර යුගයට ඓතිහාසික මූලාශ්‍රයෝ, පි., 1-4, -**සත්රවිදු ලිපි සරණිය**", ශාස්ත්‍රාරවින්ද්‍ර ආයතනය (වයඹ), I කලාපය -වාර්ෂික සංග්‍රහය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.
06. කරුණානන්ද, යූ.බී. (1993), **තමන්කඩුව 1815-1900**, අභය මුද්‍රණ ශිල්පියෝ, මහර.
07. ගොඩකුඹුරේ, චාල්ස්. (1965), **සත්කෝරළයේ ශිල්පශාස්ත්‍ර**, පි., 53-62, **සාහිත්‍ය ත්‍රෛමාසික** සඟරාව, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ.
08. ජයවර්ධන, එස්.කේ. (1965), **හස්තිශෛල පුරාණය**, පි., 3-13, **සාහිත්‍යය, ත්‍රෛමාසික සඟරාව**, සංස්කෘතික දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණාලය.
09. නිකොලොස්, සී.ඩබ්. සහ පරණවිතාන, ඇස්., (2005), **සංක්ෂිප්ත ලංකා ඉතිහාසය**, හෙට්ටිආරච්චි, එස්.බී. (පරි:සංස්:), සමන් ප්‍රකාශකයෝ, නුගේගොඩ.
10. පීරිස්, රැල්ෆ්. (2001), **සිංහල සමාජ සංවිධානය**, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.
11. බස්නායක, එච්.ටී. (2002), **ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය** II, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.
12. මුදියන්සේ, නන්දසේන. (1971), **කුරුණෑගල විස්තරය**, ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

13. රෝහණධීර, මැන්දිස්, (1965), **කුරුණෑගල යුගයේ ඓතිහාසික පසුබිම**, පි., 28-35, **සාහිත්‍ය ත්‍රෛමාසික සඟරාව**, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ.
14. ලියනගමගේ, ඒ. (1989), **මධ්‍යකාලීන ලංකා ඉතිහාසය**, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.
15. ලියනගමගේ, ඒ. (2005), **හස්ථිසෛලපුර ඓතිහාසික පසුතලය** පි., 201-214, **කුරුණෑගල්පුර යුගය**, සංස්: දෙගම්මැද සුමනජෝති හිමි, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.
16. ලංකා විශ්වවිද්‍යාල **ලංකා ඉතිහාසය** I, II, (1964), (1972), විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය.
17. විපස්සි හිමි, පින්නගොඩ කන්දේ., (2005), **පඬිවරු**, පි., 79-90, **කුරුණෑගල්පුර යුගය**, සංස්: දෙගම්මැද සුමනජෝති හිමි, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.
18. සන්නස්ගල, පුංචිබණ්ඩාර. (1964), **සිංහල සාහිත්‍යවංශය**, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ.
19. සන්නස්ගල, පුංචිබණ්ඩාර. (1965), **කුරුණෑගල සාහිත්‍යෝන්නතිය සහ එහි විශේෂාංග** පි., 14-18, **සාහිත්‍ය ත්‍රෛමාසික සඟරාව**, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ.
20. සිරිවීර, ඉන්ද්‍රකීර්ති., (2002), රජරට ශිෂ්ටාචාරය හා නිරිතදිග රාජධානි, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ.
21. සුමනජෝති හිමි, දෙගම්මැද., (2005), **කුරුණෑගල් නුවර**, පි., 1-17, **කුරුණෑගල්පුර යුගය**, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.
22. සුමනජෝති හිමි, දෙගම්මැද., (1965), **කුරුණෑගල්පුර සමයේ ශාසනික තත්ත්වය** පි., 19-27, **සාහිත්‍ය ත්‍රෛමාසික සඟරාව**, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ.
25. Nicholas, C.W, (1963), "Historical Topography of Ancient and Medieval Ceylon", Journal of the Ceylon Branch of the Royal Asiatic Society, Vol: VI, Colombo.
26. Culavamsa, ed: Geiger, (1925, 1927), Wilhelm, Vol: 2, (PTS), London.
27. Modder, F.H., (1893), "Kurunegala Vistara: with notes on Kurunegal Ancient and Modern, Journal of the Ceylon Branch of the Royal Asiatic Society, Vol:III, No: 44, Colombo.
28. Epigraphia Zeylanica, (1928-1933), Vol-III & V.
29. Bell, H.C.P., (1892), XIX, Report on the Kegalle District of the Province of Sabaragamuwa., Government Printer, Ceylon.
30. Pathmanathan, S, (1978), The Kingdom of Jaffna, Part-1, Ceylon Newspapers, Ltd, Colombo.
31. Indrapala, (1970), "The Origin of the Tamil Vanni Chieftaincies of Ceylon", The Ceylon Journal of the Humanities, Vol-I, No: 3, July-1970, University of Ceylon, Peradeniya, p. 111-140.
32. Ranawella, Sirimal, (1999), The Inscription of Apa Kitadbo and kings Sena I, Sena II, and Udaya III, Sridevi printers, Dehiwala.
33. Gunesingha, P. A.T., (1987), The Political History of the kingdoms of Yapahuva, Kurunegala and Gampola, Lake House, Colombo.

# 41

# සිංහල ජනකතාවෙන් පිළිබිඹු වන දේශීය ජන ජීවිතය

*අනුෂා මැණික් කුමාරි*

ජනකතාව ලෝකය පුරා ම ප්‍රචලිත වූ, සෑම රටක ම, සංස්කෘතියකම දකින්නට පුළුවන් වූ ජනශ්‍රැති අංගයකි. අකුරු ලිවීමට කියවීමට නොදන්නා ජනතාව අතර මෙන් ම සාක්ෂරතාවෙන් ඉහළ සමාජවල ද ජනකතාව නම් සංහිත්‍යාංගය ජනප්‍රිය ව පවතී. ජනකතාව යනු කතාන්දර විශේෂයකි. මේවායේ අන්තර්ගත කතාවල එන සිද්ධිදාමය අතර මුල-මැද-අග මනාව ගළපා කතාව ගොතා ඇත. ජනකතා අසා ගෙන සිටින විට රස විඳින්නා තුළ කුතුහලයක් ඇති කිරීමක් සිදු වන අතර කුතුහලය උද්දීපනය කිරීම උදෙසා අධිස්වාභාවික චරිත හෝ අද්භූත සිද්ධි එකතු කිරීමක් සිදු කර ඇත.

මානව ජීවිතයේ සුවිශේෂ අවස්ථාවල දී මේ ජනකතා ප්‍රයෝජනයට ගැනේ. කුඩා දරුවන්ට "සීයා, ආච්චි" වැනි වැඩිහිටි ඥාතියෙකු විසින් ජනකතා කියා දෙනු ලැබේ. මේ ජනකතා දරුවාගේ සමාජානුයෝජනය හා සම්බන්ධ වෙයි. ඔහු හැදෙන වැඩෙන විට ඔහුට අවශ්‍ය දන නුවණ ඒ ජනකතාවලින් ලැබෙයි. ගැහැනු දරුවෙකු වැඩිවියට පත්වූ පසු ද ඇයට ඇවසි දැනුම ලබා දීමට ජනකතා බොහෝ සේ ඉවහල් වෙයි. දරුවන්ගේ සිත් ගන්නා අන්දමට සකස් වූ ජනකතා ළමා ලෝකයේ ඉතා ජනප්‍රිය වූ කතාන්දරය.

ජනකතාවල අන්තර්ගත චරිත මඟින් ජනයාගේ භෞතික සංස්කෘතිය හා බැඳුණු සිද්ධි මෙන්ම අභෞතික සංස්කෘතිකාංග පිළිබඳ ව ද තථ්‍ය තොරතුරු අනාවරණය වේ. මේ නිසා දේශීය ජනජීවිතය මැනවින් විවරණය කර දැක්වීමට ජනකතාව ඉවහල් වේ. ශ්‍රී ලාංකේය ජනතාවගේ ආහාරපාන, ඇඳුම් පැලඳුම්, ජීවිකා වෘත්තීන්, වාසස්ථාන මෙන් ම ඔවුන් තුළ පැවති ඇදහිලි, විශ්වාස ආදිය පිළිබඳව දළ විමසුමක් මේ ලිපිය මඟින් ඉදිරිපත් කෙරේ.

දේශීය ජනයාගේ ආහාර අතර ප්‍රමුඛස්ථානය හිමිවූයේ බත්වලටය. ශ්‍රී ලංකාවෙන් වැඩිපුර ප්‍රදේශයක ගොවිතැන් කටයුතු සිදුකළ අතර වී ගොවිතැන ඒ අතර ප්‍රධාන විය. ඇතැම් ප්‍රදේශයක වැසියෝ තුන් වේලම බත් අනුභව කළහ. එයට නිදර්ශනයක් ලෙස,

> "පානම්පත්තුවේ උන්දලා තුන් වේලටම බත් කනවා ...... පානම්පත්තුව පුරා එක සාගරයට කුඹුරු තියෙනවා. ඒ නිසා ඕනතරං කැකුලු හාල් තියෙනවා ..."[1]

යන උද්ධෘතය දැක්වි හැකිය.